# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

අසිත අබේගුණවර්ධන,
අංක 42, මුදියන්සේගේවත්ත,
අලුත් පාර,
දික්වැල්ල.

<u>**අභියාචක**</u>

**අභියාචනා අංකය : 648/2022** එදිරිව

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර,
මාතර.

<u>**පොදු අධිකාරිය**</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ සහකාර දිස්ත්‍රික් ලේකම් ආර්. ලක්මාලි තේනුවර මිය (තොරතුරු නිලධාරි) සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නොමැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නොමැත.

**විභාග කළ දිනය** : 2022.06.08

**තීරණය කළ දිනය** : 2022.06.08

<u>**කොමිෂන් සභාවේ තීරණය :**</u>

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2021.10.15 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*“1. ඇමුණුමෙ සදහන් විමර්ශනය (421.බී වත්තේගම (දකුණ) ග්‍රාම නිලධාරී විසින් පදිංචිය සනාථ නොකිරීම පිළිබඳව යොමු කර ඇති පැමිණිල්ල) සිදු කලේ කවදද?*
*2. ඊට කිසිවකුගෙන් සාක්ෂි ලබා ගත්තේද? ඒ මොනවද?*
*3. මෙම විමර්ශනයට අදාල භාවිත කල තොරතුරු වල මුලාශ්‍ර මොනවද? එහි සහතික කල පිටපත් ලබා දෙන මෙන්ද?*

*4. මෙම සම්පූර්ණ විමර්ශන ගොනුවේ (මා විසින් ලබා දුන් සියලුම ලේඛනද සහිතව) සහතික කල පිටපත ලබා දෙන මෙන්ද කුමන හෝ ලබා දිය නොහැකි වන්නේ නම් ඊට අදාල හේතු මොනවද?"*

මීට ප්‍රතිචාර ලෙස තොරතුරු නිලධාරි 2022.01.20 වන දිනැතිව සඳහන් කර සිටින ලද්දේ,

*"................. ඔබ විසින් ඉල්ලා ඇති DSM/INV/DICKW/18 ගොනුවට අදාලව පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමි.*

*1. දිනය : 2021.04.08/09 හා 021.10.21 යන දිනයන්*

*2. ඔව්, ලිඛිත හා වාචික ප්‍රකාශ ලෙස ලබා ගෙන ඇත.*

*3. ඔබගේ ඉල්ලීමේ අංක 03 හා 04 සඳහා තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙතින් උපදෙස් විමසා ලිපියක් යොමු කොට ඇත. ඒ සඳහා පිළිතුරු ලද පසු ඔබ වෙත තොරතුරු දැන්වීමට සලකා බැලීමට අපේක්ෂිතය."*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2022.02.09 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත.

මීට ප්‍රතිචාර ලෙස නම්කළ නිලධාරි 2022.02.17 වන දිනැතිව සඳහන් කර සිටින ලද්දේ,

*"2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5(1)(2) (අ) වගන්තිය අනුව ඔබගේ අභියාචනය සඳහන් තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කල බව කරුණාවෙන් දන්වමි."*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2022.03.22 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

**සලකා බැලීම**

අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අංක 03 සහ 04 ට අදාළ තොරතුරු ලබා දීම පොදු අධිකාරිය විසින් පනතේ 5 (1) (අ) යන්න වගන්තියේ ප්‍රතිපාදන මත ප්‍රතික්ෂේප කර ඇත. පොදු අධිකාරිය දක්වන ලද කරුණු අනුව අංක 03 සහ 04 ට අදාළ තොරතුරු සම්පූර්ණ වශයෙන් මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීම අනුමත කළ නොහැකිය. අංක 03 සහ 04 ට අදාළ තොරතුරු තුළ තුන්වන පාර්ශවයකට අයත් හෙළිදරවු නොකළ යුතු තොරතුරක් තිබේ නම්, එම තොරතුර අත්හැර සෙසු තොරතුරු මුදා හැරීමට පොදු අධිකාරියට හැකියාව ඇති බව අපට පෙනී යයි. එබැවින්, මෙම කරුණු සළකා බලා තොරතුරු ඉල්ලීමේ අංක 03 සහ 04 ට අදාළව හෙළිදරවු කළ හැකි තොරතුරු තෝරාගෙන ඒවා මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, 2022.06.30 දිනට ප්‍රථම අභියාචකට මුදා හැරීමට, පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට අපි තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.